# නන්දි විසාල ජාතකය

තවද එක්සමයෙක්හි අසම ධූර වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවාසන සේක් ෂඩ්වර්ගික භික්ෂූන්ගේ පරුෂතෙපල්ලක් අරභයා මේ ජාතකය වදාළ සේක. එසමයෙහි වනාහි ෂඩ්වර්ගික භික්ෂූහු ඩබරකරන්නාහු ප්‍රියශීලි භික්ෂූන්ට ගර්හා කෙරෙති. අතිවචනශරප්‍රහාර දෙති. දශවිධ ආක්‍රොශ වස්තුවෙන් ආක්‍රෝශ කෙරෙති. භික්ෂූන් වහන්සේලා භාග්‍යවතුන් වහන්සේට දැන්වූවාහුය. භාග්‍යවතුන් වහන්සේ ෂඩ්වර්ගික භික්ෂූන්  කැඳවා ගෙන්වා මහාණෙනි ඩබරකරන්නේ සැබෑවදැයි විචාරා වදාරා භාග්‍යවතුන් වහන්සේ සැබෑවයි දැන්වූ කල්හි ගර්හාකොට මහණෙනි පරුෂවචනය නම් තිරශ්චිනගතයන්ට ද අමනෝඥවන්නේය. පූර්වයෙහි ද එක් තිරශ්චීනගත සත්වයෙක් තමාට පරුෂ වචනයෙන් කියන්නාහු දස දහසකින් පරාජය කෙළේයයි වදාරා ඉකුත්වත් දක්වා වදාළ සේක.

යටගිය දවස ගන්ධාර රට තක්සලා නුවර ගන්ධාර නම් රජෙක් රාජ්‍යය කෙරෙයි, එකල්හි අප මහාබෝධිසත්වයන් වහන්සේ ගව ජන්මයෙහි උපන් සේක. ඉක්බිත්තෙන් බෝධිසත්වයන් වහන්සේ ළදරු වසුපැටවි කාලයෙහිම එක් බ්‍රාහ්මණයෙක් ගවයන් දෙන්නාවූ දායකයන්ගේ සමීපයට ගොස් ගවයෙක් ලැබගෙන නන්දිවිශාල යයි කියා නමක්කොට පුත්‍රස්ථානන්තරයෙහි තබා බොහෝ ඕහට ප්‍රියවෙමින් කැඳ බත් ආදියද පොෂ්‍ය කරන්නේය. අප මහ බෝධිසත්වයන් වහන්සේ වැඩි වයසට පැමිණි සේක් මම මේ බ්‍රහ්මණයා විසින් දුකසේ රක්ෂාකරණ ලද්දේමි. මා හා සමග සියලු ජම්බුද්වීපයෙහි මා සදාසවීම උසුලන අනික් ගවයෙක් නම් නැත්තේය. එහෙයින් මම තමාගේ බලය දක්වා බ්‍රාහ්මණයාහට මා රක්ෂා කළාට මිළ දුන්නෙමි වීනම් ඉතා යෙහෙකැයි සිතූ සේක. මෙසේ සිතා බෝධිසත්වයන් වහන්සේ එක් දවසක් බ්‍රහ්මණයාට වගකියන සේක් බ්‍රහ්මණය යව ගවයන් ධනකොට ඇති එක් සිටාන කෙණෙකුන් කරා එළඹ මාගේ ගව තෙම එකට බැඳනාලද ගැල් සියයක් අදනේයයි කියා දහසකින් පරදු තබවයි කියේය. ඒ බ්‍රහ්මණ තෙම සිටානන්ගේ සමීපයට ගොස් කථාවක් පහළ කොළෝය. මේ නුවර  කවරක්හුගේ ගවයෝ කාය ශක්තියෙන් යුක්ක දැයි කියේය. ඉක්බිත්තෙන් ඕහට සිටුපුත්‍ර කියනුයේ අසවල්හුගේය අසවල්හුගේයයි කියා සියලු නුවරෙහි අපගේ ගොන් හා සදශ ගවයෝ නැත්තෝය. බ්‍රහ්මණ තෙම කියනුයේ මාගේ ඒකාබද්ධ කොට බඳනා ගැල් සිසයක් අදනට සමර්ථ එක් ගොණෙක් කොයින්දැයි කීහ. බ්‍රාහ්මණතෙම මාගේ ගෙයි ඇත්තේයයි කීයේය. එසේ වී නම් පරදුව තමවයි කීම. යහපත කරන්නේම් කියා දහසින්  පරදු කළේය. බ්‍රාහ්මණ තෙමෙ ගැල් සියක් වැලි කැටකැබලි ගලින්ම පුරවා පිළිවෙලින් තබා සියල්ල අකර බඳිනා යොතින් එකට බැඳ නන්දිවිශාල නම් ගවයා නහවා සුවඳින් පසඟුල් දී ග්‍රීවායෙහි මල් පළඳවා පළමු ගැල්  ධුරයෙහි හුදකළාවම යොදා තෙමේ ගැල්හි හිඳ කැවිට ඔසවාගෙණ අදුව කූළ උසුලව කූළයි කීයේය. බෝධිසත්වයන් වහන්සේ මේ තෙමේ අකුළුවූ මට කුළුවචනයෙන් කියන්නේ යයි කිසා සතරපය ටැඹක් මෙන් නිශ්චල කොට සිටිසේක.  සිටානෝ එකෙණෙහිම බ්‍රාහ්මණයාගෙන් වස්තු දහස ගෙන්වාගත්තෝය. බ්‍රහ්මණ තෙමේ දහසෙකින් පැරදුනේය. ගවයා මුදාහැර ගෙට ගොස් ශෝකයෙන් මඩනාලදුව හොත්තේය. නන්දිවිශාල නම් ගොණා තණ කා ආයේ ශෝකයෙන් මඩනා ලද බ්‍රාහ්මණයා දැක සමීපයට එළඹ බ්‍රාහ්මණය කවර හෙයකින් නිද්‍රාව කරන්නෙහි දැයි කීයේය. දහසකින් පැරදුනා වූ මට නිදි කොයින් දැයි කීය බ්‍රාහ්මණය මෙපමණ කලක් තොපගේ ගෙයි වසන්නවූ මා විසින් කිසි භාජනයක් බිඳපීමක් හෝ කිසිවක් මැඩ මීරිකීමක් හෝ නුසුදුසු තැනෙක්හි මලමුත්‍ර බැහීමක් හෝ කළවිරී දැයි කීයේය. පුත්‍රය එවැනි දෙයක් නැත්තේයයි කීය. එසේ කල්හි මට කවර කාරණයකින් කුළුවාදයෙන් කීයෙහිද?. මේ තෙම තොපගේ දෝෂ වන්නේය. මාගේ දෝෂයෙක් නැත්තේය. යව ඒ සිටානන් හා සමග වස්තු දෙදහසකින් පරදු කොට තබව. හුදෙක් අකුළු වූ මට කුළවාදයෙන් කථා නොකරවයි කීයේය. බ්‍රහ්මණ තෙම මහබෝධිසත්වයන් වහන්සේගේ වචනය අසා ගොස් වස්තු දෙදහසකින්  ඇපකොට තබා යට කියන ලද ක්‍රමයෙන්ම ගැල් සියය ඒකාබද්ධ කොට බැඳ නන්දිවිශාල නම් වෘෂභයා සරහා පළමු ගැල්වියෙහි යෙදුයේය. කෙසේ යෙදුයේද යත් විය ගැලෙහි නිශ්චල කොට බැඳ එක් කෙළවරක නන්දිවිශාල නම් වෘෂභයා යොදා එක් කෙළවරක් ගැල්යොතින් වෙළා විය කෙළවර අකුරක ඇණමුල නිසා මුඩුරුක් දණ්ඩක්දී ඒ යොතින් නිශ්චලකොට බැඳ තැබූයේය. එසේ කළ කල්හි විය එයට හෝ මෙයට හෝ නොවන්නේය. එක ගොණෙකු විසින් ඇදගන්නට හැකි වන්නේය. ඉක්බිත්තෙන් ඒ බ්‍රාහ්මණ තෙම ගැලහෙි හිඳ නන්දිවිශාල නම් වෘෂභයාගේ පිට පිරිමැද මාගේ පුත්‍ර වූ යහපත් වෘෂභය මේ ගැල් යෙහෙන් අදුව උසුලුව යහපතැයි කීය. බෝධිසත්වයන් වහන්සේ ඒකාබද්ධව බඳනාලද ගැල් සියය එකවේගයෙන්ම ඇද පසුව සිටි ගැල අභිමුඛයෙහි ගැල පිහිටි තැන තිබූය. ගව ධනය කොට ඇති සිටානෝ පැරද බ්‍රහ්මණයා හට වස්තු දෙදහසක් දුන්නෝය. අනිකුත් මනුශෂයෝද බෝධිසත්වයන් වහන්සේට බොහෝ වස්තු දුන්නාහුය. ඒ සියලු වස්තුව බ්‍රාහ්මණයාහටම වූයේය. මෙසේ බෝධිසත්වයන් වහන්සේ නිසා බොහෝ වස්තුව ලද්දේය. සර්වඥයන් වහන්සේ වදාරණසේක් මහණෙනි පරුෂ වචනය නම් කිසිවක් හටත් මනාප නො වන්නේ යයි ෂඩ්වර්ගික භික්ෂූන්ට ගර්හාකොට ශික්ෂා පද පණවා මෙසේ වදාළසේක. අන්‍යයා හා සමග කථා කරන්නේ චතුර්දෝෂ විරහිත වූ මිහිරිවූ මටසිළුටු වූ මොළොක් වූ ප්‍රියවචනයෙන් ම බිණිය යුත්තේය. කිසිකලෙක්හිත් අමනෝඥ වචනය නො බිණිය යුත්තේය. කුමක් හෙයින්ද? යත් නන්දිවිශාල නම් වෘෂභ තෙම අමනාප වචන කියන්නහුගේ බර නො ඇද පසුව මනාප වූ ප්‍රිය වචනය කියන්නාවූ බ්‍රාහමණයාගේ ගරු භාරය ඇද්දේ යයි මෙසේ සර්වඥයන් වහන්සේ මනෝඥ වචනය බිණිය යුතුයයි මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා මේ නන්දිවිශාල ජාතකය නිමවා වදාළ  සේක.

එසමයෙහි බ්‍රාහ්මණතෙම දැන් මේ කාලයෙහි ආනන්ද ස්ථවිරයන් වූයේය. නන්දිවිශාල නම් වෘශභව උපන්නෙම් වනාහි තිලෝගුරු සම්‍යක් සම්බුදු රජ වූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළ සේක.